**ලංසු සඳහා ආරාධනයයි**

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**<u>Calypso විශේෂ දුම්රියේ භෝජනාගාරය බදු ලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.</u>**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් Calypso විශේෂ දුම්රියේ ජංගම භෝජනාගාරයේ ආහාරපාන අලෙවි කිරීමේ සේවාව වසර දෙකක කාලයකට බදු පදනම මත පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් සහිත පාර්ශව වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

**<u>01.සුදුසුකම්</u>**

- මෙම කොන්ත්‍රාත්තුවට අදාල ව්‍යාපාරය හෝ සමාගම, ව්‍යාපාර නාම ලියාපදිංචිය යටතේ/සමාගම් ලියාපදිංචිය යටතේ, ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචිකර වලංගු ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.
- සෑම අයදුම්කරුවකුම/ආයතනයක්ම සංචාරක මණ්ඩලයේ වලංගු ලියාපදිංචි සහතිකයක් සහිත විය යුතුය (ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් කරන දිනට).
- භෝජනාගාර ක්ෂේත්‍රයේ සේවා සැපයීම පිළිබඳ අවම වශයෙන් වසරක කාලයක පලපුරුද්ද.
- මූල්‍ය ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ප්‍රමානවත් ලේඛන බදුකරු විසින් ඉදිරිපත් කල යුතුය.

**<u>02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම</u>**
ප්‍රසම්පාදන ලියවිලි 2024 සැප්තැම්බර් මස 26 වන දින ප.ව. 2.00 දක්වා සතියේ දිනවල පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා දුම්රිය වෙළද හා අලෙවි කාර්යාලයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළද හා අලෙවි) වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය.

**<u>03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම</u>**
Calypso දුම්රිය ජංගම භෝජනාගාරය වෙනුවෙන් ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසිපරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන්කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "Calypso විශේෂ දුම්රිය භෝජනාගාර සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2024 සැප්තැම්බර් මස 27 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, වෙළද හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10. ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළද හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**<u>04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම</u>**
2024 සැප්තැම්බර් මස 27 වන දින ප.ව. 2.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළද හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

05. ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් අදාල දුම්රිය ජංගම භෝජනාගාරය පරික්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා දුම්රිය මූලස්ථාන වෙළද හා අලෙවි කාර්යාලය මගින් අවසර ලබාගතයුතු වේ.

06. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

07. ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) 0114 600944 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළද හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වෙළද හා අලෙවි කාර්යාලය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.